# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ


අංක 1859/64 - 2014 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා - 2014.04.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, 2012.09.21 දිනැති අංක 1776/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 2A පිටුවේ අංක : 10 - 368 යටතේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි "ඉඩමේ නම හින්න උඩ ඉඩම" යනුවෙන් සඳහන් වූවත් අනුරාධපුර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු නියානි/7/LA/1924 අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක Aa/MDW/2013/656 දරන ප්‍රගමන අනුරේඛනයේ සඳහන් පරිදි, ඉඩමේ නම "ඇතාකඩකැලේ " යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැඳුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/980.

05-326

---

නියානි/7/LA/2039

### ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, 2013.06.13 දිනැති අංක : 1814/62 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 2A පිටුවේ අංක 06 - 790 යටතේ පළ කරන ලද නිවේදනයේ


1A - G 19471— 80 (2014/04)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනයෙහි දකුණට "එම ඉඩමේ ඉතිරි කොටස ද" "බටහිරට : එම ඉඩමේ ඉතිරි කොටස" යනුවෙන් , සංශෝධනය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1004.

05-327

---

එල්ජී/2100

## 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

### 92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට වරකාපොල ජල සම්පාදන ක්‍රමයේ තුළුමං ළිඳ, ප්‍රවේශ මාර්ගය හා නිල නිවස ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1020.

**උපලේඛනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුල්හිරිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තුල්හිරිය ගමේ පිහිටි හපුගස්තැන්නඹිවිට නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් රූඩ් 01, පර්චස් 27ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාඔය ; |
| *නැගෙනහිරට* | : | මෙම සැලැස්මේ කැබලි අංක D ; |
| *දකුණට* | : | අඹේපුස්ස සිට අලව්ව දක්වා මාර්ගය ; |
| *බටහිරට* | : | පිඹුරු අංක 948A හි කැබලි අංක 02 |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 01. එච්. ජී. එම්. පී. අමරසිංහ මයා,
අංක 60/1, නයිවල,
එස්සැල්ල.

05-328

එල්ජී/2198

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට උඩවෙල ජල සම්පාදන ක්‍රමයේ ජල පිරිපහදු ඒකකය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1021.

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්ලේන් ඇල්පින් ග්‍රාම නිලධාරී වසමේ වේවැස්සවත්ත ගමේ පිහිටි වේවැස්සවත්ත නමැති ඉඩමෙන් පර්චස් 80ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස හා බදුල්ල, පස්සර මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | එම ඉඩමේ ඉතිරි කොටස හා ක්ලෝරින් කුටිය ; |
| *බටහිරට* | : | බදුල්ල පස්සර මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 01. ප්‍රධාන විධායක නිලධාරී,
සී. ස. බදුල්ල වැවිලි සමාගම,
වේවැස්ස වත්ත,
බදුල්ල.

05-329

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.